අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/06/05/02

ඔබේ යොමුව / உமது இல. / Your Ref.

දිනය / திகதி / Date 2024.05.27

සියලු ම පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලු ම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම කොට්ඨාස භාර නියෝජ්‍ය / සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලු ම පරිවේණාධිපති හිමිවරුන්,
සියලු ම රජයේ පාසල් හා රජයේ අනුමත පෞද්ගලික පාසල්වල විදුහල්පතිවරුන් වෙත

**අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය අවසන් වීමෙන් පසුව අ.පො.ස. (උසස් පෙළ) පන්ති ආරම්භ කිරීම**

උක්ත මැයෙන් 2024.05.15 දින නිකුත් කරන ලද අංක 20/2024 චක්‍රලේඛයට අමතර වශයෙනි. එම චක්‍රලේඛයේ උපදෙස්වලට අමතරව අදාළ නියමු වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් උපදෙස් ද අනුගමනය කරන ලෙස කාරුණික ව දන්වමි.

- සිසු සිසුවියන් අ.පො.ස. (උසස් පෙළ) විෂය ධාරාව සඳහා තාවකාලික අනුයුක්ත කිරීම සිදු කළ කාල සීමාව තුළ පැමිණි දින ගණන, අ.පො.ස. (උසස් පෙළ) විභාගය සඳහා පෙනී සිටීමේ දී 80% පැමිණීමේ ප්‍රතිශතයට සලකා බලනු ලැබේ.

- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාග ප්‍රතිඵල මත අ.පො.ස. (උසස් පෙළ) හැදෑරීම සඳහා වෙනත් පාසලකට ඇතුළත් වීමේ දී මෙම තාවකාලික අනුයුක්ත කිරීම අනුව යම් පාසලකට ඇතුළත්ව ඉගෙනුම ලබා තිබීම ප්‍රමුඛතාවයක් ලෙස සලකනු ලැබේ.

  ඒ අනුව, සිසු සිසුවියන් අ.පො.ස.(සාමාන්‍ය පෙළ) ප්‍රතිඵල මත වෙනත් පාසලකට ඇතුළත් වීමට ඉල්ලුම් කරන අවස්ථාවලදී, අනුයුක්ත කාල සීමාව තුළ පාසල් පැමිණීම සහ විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ වාර්තාවක්, තාවකාලිකව අනුයුක්තව සිටින පාසලේ විදුහල්පති විසින් නිකුත් කළ යුතු අතර එය අමතර සුදුසුකමක් ලෙස සලකා බැලිය යුතු ය.

- රජයේ අනුමත පෞද්ගලික පාසල්වල අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සිසු සිසුවියන් සඳහා ද මෙම නියමු වැඩසටහන අදාළ කරගත හැකි ය.

තව ද, උක්ත 20/2024 චක්‍රලේඛයේ 1.7 හා 1.8 යන වගන්ති මඟින් දක්වා ඇති පරිදි පහසුකම් හා සේවා ගාස්තු, නිල ඇඳුම සහ ශිෂ්‍ය කාර්ය දර්ශනය සම්බන්ධයෙන් ලබා දී ඇති උපදෙස් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කර කටයුතු කළ යුතු ය.

Jayasundara

ජේ.එම්.තිලකා ජයසුන්දර
ලේකම්



CamScanner